ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

විෂය:- මව්බස

කාර්ය පත්‍රිකාව :- කාර්ය පත්‍රිකා 5

ශ්‍රේණිය:- 3 ශ්‍රේණිය

**(1) පාඩම හොඳින් කියවා වාචිකව පිළිතුරු සපයන්න**



# 3 අපේ නිදහස් උත්සවය

කවිඳු යාළුවොත් එක්ක මිදුලේ සෙල්ලම් කරමින් සිටියා. "පුතා යාළුවොත් එක්ක මෙහෙට එන්න" කවිඳුගේ අම්මා කතා කළා. කවිඳු යාළුවොත් එක්ක ගේ ඇතුළට ආවා. අම්මා රූපවාහිනිය බලනවා. රූපවාහිනියේ ලොකු උත්සවයක් පෙන්වනවා.

හමුදා පෙළපාළි

යුද්ධ ටැංකි

අහසේ කරණම් ගසන ගුවන් යානා

පැරෂුට් භටයෝ

7


තවත් බොහෝ දේවල් රූපවාහිනිය මත දිග හැරෙනවා. කවිඳුටයි යාළුවන්ටයි මේක හරි ම ප්‍රහේලිකාවක්.

ඒ හින්දා ම කවිශා ප්‍රශ්නයක් ඇහුවා. "මොකක් ද තාත්තේ මේ උත්සවය?"

"ඒ පුතේ අපේ රටේ නිදහස් උත්සවය."

"මොකක් ද නිදහස් උත්සවය කියන්නේ?" ඒ ප්‍රශ්නය ඇහුවෙත් කවිශා ම යි.

"හැමෝම අහගන්නකෝ." කවිඳුගේ අම්මා උත්තර දෙන්න සූදානම් වුණා.



පළමුවන නිදහස් උත්සවය

"අපේ රට 1815 අවුරුද්දේ ඉඳලා බ්‍රිතාන්‍ය ජාතිකයන්ට යටත් වෙලයි තිබුණේ. 1948 පෙබරවාරි හතරවන දා අපි ඔවුන්ගෙන් නිදහස් වුණා. ඊට පස්සෙ හැම අවුරුද්දක ම පෙබරවාරි හතරවන දා අපි නිදහස් දිනය උත්සවාකාරයෙන් සමරනවා. ඒක අපේ රටේ පවත්වන ජාතික උත්සවයක්."

"ඒ හින්දා ද අම්මේ තාත්තා අද ජාතික කොඩියක් එල්ලුවේ?" ඒ ප්‍රශ්නය ඇහුවේ කවිඳු. "අන්න හරි. නිදහස් දිනය දවසට ශ්‍රී ලංකාවේ අපි හැමෝම හැම ගෙදරක ම ජාතික කොඩිය ප්‍රදර්ශනය කරනවා. නිදහස් දිනය කියන්නේ අපේ අභිමානය ලෝකෙට ම පෙන්නන දවසක්. ඒ ජාතික උත්සවය තමයි පුතේ ඔය රූපවාහිනියේ පෙන්වන්නේ." කවිඳුගේ අම්මා උත්තර දුන්නා.

යාළුවෝ හැම දෙනා ම නිදහස් උත්සවය බැලුවා.



01) කවිඳුගේ අම්මා කුමක් කරමින් සිටියේද?

02) පුතා යාළුවොත් එක්ක මෙහෙට එන්න .එසේ කීවේ කවුද?

03) අපේ රටේ නිදහස් උත්සවය සමරනු ලබන්නේ කවදාද?

04) නිදහස් දිනය දාට සෑම ගෙදරකම ප්‍රදර්ශනය කරනු ලබන්නේ කුමක්ද?

05) නිදහස් දින උත්සවයේදී අපේ රටේ හමුදාව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් මොනවාද?

06) පහත සඳහන් වචන ශබ්ද නගා කියවන්න.

1) පැරෂුට් හටයෝ 2)බ්‍රිතාන්‍ය 3)උත්සවාකාරයෙන්

4)කරණම් 5) අභිමානය

07) ජාතික කොඩියේ තිබෙන සත්ත්ව රූපය කුමක්ද?

08) 2020 වර්ෂයේ සමරනු ලැබුයේ කීවැනි නිදහස් දින උත්සවය ද?

09) අපේ රට යටත් කරගෙන සිටියේ කුමන ජාතීන් විසින්ද?

10) අපේ රට විදේශිකයන් යටත් කර ගත්තේ කුමන වර්ෂයක සිටද?

(02) පහත ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

අපේ රට 1815 අවුරුද්දේ ඉඳලා බ්‍රිතාන්‍ය ජාතිකයන්ට යටත් වෙලයි තිබුණේ.

1948 පෙබරවාරි හතරවැනිදා අපි ඔවුන්ගෙන් නිදහස් වුණා.ඊට පස්සේ හැම අවුරුද්දකම පෙබරවාරි හතරවැනිදා අපි නිදහස් දින උත්සවාකාරයෙන් සමරනවා.ඒක අපේ රටේ පවත්වන ජාතික උත්සවයක්.

01) අපේ රට 1815 අවුරුද්දේ සිට යටත් වී තිබුණේ කුමන ජාතිකයන්ටද?

.......................................

02) එම ජාතිකයන්ගෙන් අප රට නිදහස් වූයේ කවදාද?.............................

03) මෙහි සඳහන් වන අපි උත්සවාකාරයෙන් සමරන ජාතික උත්සවය කුමක්ද?.....................................................

04) මෙම ඡේදය උපුටාගත් පාඩම කුමක්ද?..................................

05) රකාරාංශය යෙදුණු වචනයක් සොයා ලියන්න?.......................................

06)පහත දැක්වෙන වචන වලට සමාන තේරුම් දෙන පද ඡේදයෙන් සොයා ලියන්න.

දවස:-..................................   නවම් මස:-...................................

වර්ෂයකම:-.........................   සිව්වනදා:-...................................

07) ඡේදයේ දැක්වෙන විරාම ලකුණක නමක් ලියන්න?.................................

08) ඉරි ඇඳි අකුරෙහි යෙදී ඇති පිල්ලම් නාමය ලියන්න.

1. දිනය:-........................   4. අවුරුද්ද:-............................

2. හැම:-..........................   5.රටේ:-..................................

3. වුණා:-.........................   6. පෙබරවාරි :- .......................

09) පහත දැක්වෙන වචනවල හිස්තැන් සම්පූර්ණ කිරීමට ගැළපෙන අකුරු වරහන් තුළින් තෝරා ලියන්න.

1. රූපවාහි_ය(ණි/නි)   4. අ_මානය(භි/ඹි)

2. පැර_ට්(ෂු/සු)   5. ප්‍රදර්_නය(ශ/ෂ)

3. කර_ම(න/ණ)   6. ප්‍ර_නය(ස්/ශ්)

10) පහත සඳහන් වැකි ගලපා ලියන්න.

1) සූදානම/උත්තරය/වුණා/අම්මා/කවිඳුගේ/දෙන්න

2) උත්සවාකාරයෙන්/අපි/දිනය/සමරනවා/නිදහස්

3) ලොකු/පෙන්වනවා/රූපවාහිනියේ/උත්සවයක්

4)නිදහස්/බැලුවා/දෙනා ම/යාළුවෝ/උත්සවය/හැම

5) පෙන්නන/අභිමානය/නිදහස්/කියන්නේ/දිනය/ලෝකයට ම/ අපේ/දවසක්

## <u>පෙර වැඩ</u>

01) අපේ රටේ පැවැත්වෙන නිදහස් උත්සවය පිළිබඳව කරුණු වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

02)නිදහස් උත්සව අවස්ථා පිළිබඳ පුවත්පත් වලින් තොරතුරු රැස් කරන්න.

03) පෙළ පොතේ පාඩම නිශ්ශබ්දව හා ශබ්ද නගා වාර කීපයක් කියවා ගැනීමට යොමු කිරීම.

04) නිදහස් උත්සවයෙ වීඩියෝ දර්ශන නැරඹීමට අවස්ථාවක් සලසා දෙන්න.

## <u>පසුවැඩ</u>

01) නිදහස් උත්සවයේ දර්ශනය වූ එක් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

02) අපට නිදහස ලැබුණා කවියක් නිර්මාණය කරන්න.

03) අපේ රටේ නිදහස් උත්සවය සැමරීම පිළිබඳව අර්ථවත් වැකි තුනක් ලියන්න.

04) නිදහස් දිනය සැමරීම වෙනුවෙන් කරනු ලබන දේවල් (උදා:- රුක් රෝපනය,සතුන් නිදහස් කිරීම, සිරගතව සිටින පුද්ගලයන්ට සමාව දීම,පොදු ස්ථානවල ශ්‍රමදාන පැවැත්වීම)යන ඒවායින් එක් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

05) මින් ඉදිරියටසෑම නිදහස් දිනයක් වෙනුවෙන්ම ගසක් රෝපණයකිරීමට කටයුතු කරන්න.එම ගස ට වතුර පොහොර දමා රැක බලා ගැනීමට පොළඹවන්න.

සැකසීම:-ර/ඇඹි/ඩී.ඒ.රාජපක්ෂ ප්‍රාථමික විද්‍යාලය

3ශ්‍රේණිය බාර ආචාර්ය